# බුදුගුණ භාවනා

**"බුද්ධොති කෙනට්ඨෙන බුද්ධො?** = මොන කාරණයක් නිසාද ලොව්තුරා බුදුරජාණන් වහන්සේට බුද්ධ කියලා කියන්නේ?

1) **බුජ්ඣිතා සච්චානීති බුද්ධො** = චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගත්ත නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

2) **බොධෙතා පජායාති බුද්ධො** = ඒ තමන් වහන්සේ ඒ අවබෝධ කරගත්ත චතුරාර්ය සත්‍ය ධර්මයන් අනිත් අයට දේශනා මාර්ගයෙන් අවබෝධ කර වූ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

3) **සබ්බඤ්ඤුතාය බුද්ධො** = බුදුරජාණන් වහන්සේ අතීතය අනාගතය වර්තමානය කියන්නා වූ කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන් දකින මෙනෙහි කරන මාත්‍රයෙන් පෙනෙන සියල්ල දකින්නා වූ නුවණ හෙවත් සර්වඥතාඥානය ලබා ගත් හෙයින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

4) **සබ්බදස්සාවිතාය බුද්ධො** = සියලුම දේවල් දකින බැවින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

5) **අනඤ්ඤනෙයාතාය බුද්ධො** = ලොව්තුරා බුදුරජාණන්වහන්සේට ධර්මය තේරුම් ගන්න කවුරුත් උදව්කරන්න අවශ්‍ය නැති බැවින් **බුද්ධ** කියලා කියනවා.

6) **විසවිතාය බුද්ධො** = නොයෙක් ආකාරයේ ගුණ ස්වභාවයන් පැතිරෙන නිසා පුදුලව තිබෙන නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

7) **ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො** = සියලුම ක්ලේශ ධර්මයන්, ආශ්‍රව ධර්මයන් ක්‍ෂය කරපු කෙනෙක් නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

8) **නිරුපලෙපසඞ්ඛාතෙන බුද්ධො** = උන්වහන්සේගේ සිත ඇලෙන ගතියෙන් යුක්ත නොවෙන නිසා බුද්ධයි. බුදුරජාණන්වහන්සේගේ සිත ගිය ගිය තැන, බැලු බැලු දේ ගැන, ඇසූ ඇසූ දේ ඇලෙන්නේ නෑ. ලේප කියලා කියන්නේ ඇලෙන ගතිය (sticky) මේ ඇලෙන ගතිය තිබෙන්නේ තණ්හාව කියන ධර්මයේ. තණ්හාව නම් වූ ඒ ඇලෙන ගතිය උන්වහහසේගේ සිතේ නැති නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

9) **එකන්තවීතරාගොති බුද්ධො** = ඒකාන්තයෙන්ම ලොව්තුරා බුදුරජාණන්වහන්සේ වීතරාගී බැවින් බුද්ධ නම් වෙනවා. සිතන දේවල් පිළිබඳ ඇලීමක් බැඳීමක්, හිතන දේවල් වින්දනය කිරීමක් උන්වහන්සේට නෑ. කථාවක් කළාට පස්සේ ඒ කථාව වින්දනය කිරීමේ ගතියක් උන්වහන්සේට නෑ. මොකක් හරි ගමනක් ගියාට පස්සේ විහිළු තහළු කරලා වින්දනය කරන ගතිය උන්වහන්සේට නෑ. කරන දේවල් බලන දේවල් අහන දේවල් හිතන දේවල් පිළිබඳව උන්වහන්සේ වින්දනය කර කර අහන්නේ නෑ, වින්දනය කර කර බලන්නේ නෑ, වින්දනය කර කර අහාර ගන්නේ නෑ. වින්දනය

කරනවා කියන්නේ රාගය. එහෙම ගතියක් උන්වහන්සේට නෑ. ඒකාන්තයෙන්ම විතරාගී ස්වභාවය නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

10) **එකන්තවීතදොසොති බුද්ධො** = ඒකාන්තයෙන්ම දකින දේවල් පිළිබඳ ගැටීමක් පීඩා විඳීමක් ද්වේශයක් මුකුත්ම නැති නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

11) **එකන්තවීතමොහොති බුද්ධො** - කිසිම දවසක බුදුරජාණන් වහන්සේ කිසිම ආරම්මණයක මුලාවකට පත්වෙන්නේ නෑ. ඒ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

12) **එකන්තනික්කිලෙසොති බුද්ධො** = ඒකාන්තයෙන්ම බුදුරජාණන්වහන්සේ කෙලෙස් නැති කෙනෙක්. ඒ නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

13) **එකායනමග්ගං ගතොති බුද්ධො** = සිහි නුවණින් යුක්ත වෙච්ච ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ ඒකායන මාර්ගයේ ගමන් කරපු නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

14) **එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො** = තනියමම අනුත්තර වූ සම්මා සම්බෝධියට පත් වෙච්ච නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

15) **අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා බුද්ධො** = අබුද්ධිය කියන මෝහය නම් වූ නොවැටහෙන ගතිය නැති කරලා වැටහෙන ගතිය ලබා ගත්ත නිසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට **බුද්ධ** කියලා කියනවා.

**බුද්ධොති නෙතං නාමං මාතරා කතං** = බුද්ධ කියන මේ නම මව විසින් කරපු නමක් නොවෙයි.
**න පිතරා කතං** = මේ නම සුද්ධෝදන රජතුමාගෙන් ආපු නමකුත් නොවෙයි. පියාගෙන් ආපු නමක් නොවෙයි.
**න භාතරා කතං** = ඒ පවුලේ තවත් සහෝදරයෙක් කරපු නමකුත් නොවෙයි.
**න භගිනියා කතං** = මේ නම් සහෝදරියක් විසින් කරපු නමකුත් නොවෙයි.
**න මිත්තාමච්චෙහි කතං** = නෑ දැ හිත මිත්‍රාදීන් විසින් මැති ඇමති වරුන් විසින් කරපු නමකුත් නොවෙයි.
**න ඤාතිසාලොහිතෙහි කතං** = සහලේ නෑයන් විසින් කරපු එකකුත් නොවෙයි.
**න සමණබ්‍රාහ්මණෙහි කතං** = මේ නම ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් කරපු නමකුත් නොවෙයි.
**න දෙවතාහි කතං** = මේ නම දෙවි දේවතාවෝ දීපු නමකුත් නොවෙයි.
**විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධො"** = බුද්ධ කියන මේ වචනය ලොව්තුරා බුදුරජාණන්වහන්සේ බොධීන්වහන්සේගේ මූලයේ වැඩ ඉන්නකොට උන්වහන්සේට චතුරාර්ය සත්‍ය ප්‍රතිලාභය සමග ලැබිච්ච ප්‍රඥප්තියක්.

**''අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, භාවෙතබ්බං ච භාවිතං;**
**පහාතබ්බං පහීනං මෙ, තස්මා 'බුද්ධොස්මි' බ්‍රාහ්මණ''.**

**අභිඤ්ඤෙය්‍යං** = විශේෂිත ඥානයකින් අවබෝධ කරගත යුතු ධර්ම වලට කියනවා අභිඤ්ඤෙය්‍යා ධර්ම කියලා.

**අභිඤ්ඤාතං** = ඒ අභිඤ්ඤෙය්‍යා ධර්ම සියල්ලක්ම බුදුරජාණන්වහන්සේ අවබෝධ කර ගත්තා.

**භාවෙතබ්බං ච භාවිතං** = භාවේතබ්බ කියලා කියන්නේ වැඩිය යුතු ධර්ම. සීලය වඩන්න ඕනෑ, සමාධිය වඩන්න ඕනෑ, ප්‍රඥාව වඩන්න ඕනෑ. ශ්‍රද්ධාව වඩා ගන්න ඕනෑ, වීරිය වඩන්න ඕනෑ, සතිය සමාධිය ප්‍රඥාව වඩන්න ඕනෑ. බොජ්ඣංග ධර්ම වඩන්න ඕනෑ, මාර්ග ධර්ම වඩන්න ඕනෑ. මේ වගේ වැඩිය යුතු සියලුම ධර්ම මම භාවිතා කරන ලදී.

**පහාතබ්බං** = ''ප්‍රහීණ කළයුතු අයින් කළ යුතු ඉවත් කළ යුතු දේවල්
**පහීනං** = ඒ ප්‍රහාණය කලයුතු සියලුම ධර්ම මා තුල ප්‍රහීණ වෙලා තිබෙන්නේ
**තස්මා** = අන්න ඒ නිසා
**'බුද්ධොස්මි' බ්‍රාහ්මණ** = අන්න ඒ නිසා බ්‍රාහ්මණය මම බුද්ධ නම් වෙමි'' කියලා කියනවා.

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් බුදු ගුණ භාවනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.
***